# විශේෂ පුස්තකාල මගින් සපයන සේවා පිළිබඳ සංක්ෂිප්ත විමර්ශනයක්

**- ආධුනික කථිකාචාර්ය බෝදාගම සුමන හිමි**

## හැඳින්වීම

විශේෂ පුස්තකාල යනු යම් යම් විශේෂ විෂය ක්ෂේත්‍ර පදනම් කරගෙන ක්‍රියාත්මක වන පුස්තකාල ප්‍රභේදයකි. මෙම පුස්තකාල ප්‍රභේදය පර්යේෂණ පුස්තකාල ලෙස ද හඳුන්වනු ලබන අතර යම් පුද්ගලයෙක්, සංස්ථාවක්, සංගමයක්, රජයේ නියෝජිත ආයතනයක් හෝ වෙනත් සමූහයක් විසින් පවත්වාගෙන යනු ලබන පුස්තකාල මේ ගණයට අයත් වේ. තව ද විෂය විශේෂිව බිහිකරගෙන ඇති පුස්තකාල විශේෂ පුස්තකාල ලෙස හැඳින්විය හැකිය. මෙහි එක් එක් විෂයකට හෝ විෂය කිහිපයකට පමණක් සීමා කර රැස් කරන ලද එකතුවක් දැකගත හැකිය. මෙම පුස්තකාල වර්ගයේ දී දැකිය හැකි විශේෂ ලක්ෂණය වන්නේ විෂය විශේෂී බවයි. "විශේෂ පුස්තකාලයක් යනු එක් එක් සුවිශේෂ විෂය ක්ෂේත්‍රයකට හෝ විෂය ක්ෂේත්‍ර පරාසයකට පමණක් සීමා වූ සම්පත් එකතුවක් ඇති, විශේෂ ක්ෂේත්‍ර පරාසයක අධ්‍යයනයේ නියුතු පිරිසකගේ තොරතුරු අවශ්‍යතා සපුරාලීම සඳහා සංවිධානය වූ පුස්තකාලයක් වේ." (ගුණසේකර, 1998: පි.10) තව ද එල්. ඒ ජයතිස්ස මහතා විශේෂ පුස්තකාලයක ස්වභාවය මෙසේ දක්වා ඇත. "විශේෂ පුස්තකාලයක් එහි නමින් ම ධ්වනිත වන්නාක් මෙන්ම බොහෝ කරුණුවලින් සුවිශේෂීත්වයක් උසුලයි. යම් කිසි නිශ්චිත විෂය පරාසයක් අරබයා පමණක් අවධානය යොමු කිරීම මෙහි මූලික අරමුණයි." (ජයතිස්ස, 1999: පි.133) මීට අමතරව පුස්තකාල විද්‍යාව පිළිබඳ ප්‍රාමාණිකයෙකු වන A.G.S



Josephson තම අදහස් දැක්වීමට අනුව විශේෂ පුස්තකාලයක් තනි විෂයක් හෝ විෂය කිහිපයක හඳුනාගත් පිරිස් සඳහා ක්‍රියාත්මක වන්නක් බව දක්වා ඇත්තේ මෙසේය. "Special library is to my mind a library that cover single subject or a definite group of subjects" (Josephson :1912) එසේම මීට වෙනස් ආකාරයකින් මෙම පුස්තකාලය වර්ගය පිළිබඳ ආචාර්ය එස්. ආර් රංගනාදන් මහතා මෙසේ අදහස් දක්වා ඇත. "පුස්තකාලයක කොටස් 03 කි. එනම් පාඨක, සේවක හා පොත්පත්ය. විශේෂ පුස්තකාලයක මෙම කොටස් තුනම විශේෂ වේ" (එස්. ආර් රංගනාදන්) යනුවෙනි. මේ අනුව විශේෂ පුස්තකාල යම් විෂය ක්ෂේත්‍රයක් අරබයා තෝරාගත් පිරිසක් කේන්ද්‍ර කරගත් පර්යේෂණාත්මක තොරතුරු අන්තර්ගත මධ්‍යස්ථානයක් ලෙස හැඳින්විය හැකිය.

## විශේෂිත පුස්තකාලවල අරමුණු හා අභිමතාර්ථ

විෂය විශේෂිතව පිහිටුවා ඇති තොරතුරු මධ්‍යස්ථාන මගින් අදාළ විෂය පිළිබඳ තොරතුරු සේවා සැපයීම සිදු කළ යුතුය. මෙකී අරමුණු සාධනය සඳහා විශේෂ පුස්තකාලක තිබිය යුතු අරමුණු හා අභිමතාර්ථ පහතින් දැක්වේ.

01. මවු ආයතනවල අරමුණු හා පරමාර්ථ සාධනය සඳහා සහය වීම
02. මව් ආයතනවල සාමාජිකයන්ට තම විෂය ක්ෂේත්‍රය තුල සිදුවන නව ප්‍රවර්ධන සහ ප්‍රවනතා පිළිබඳ තොරතුරු ලබා දීම
03. මවු ආයතනය ඇරඹීමට අපේක්ෂා කරන ව්‍යාපෘති සඳහා අවශ්‍ය තොරතුරු ලබා දීම
04. ඉක්මන් තොරතුරු සේවා මගින් පාඨකයාගේ කාලය ආරක්ෂා කිරීම
05. අදාළ විෂය ක්ෂේත්‍රය පිළිබඳ දේශීය හා විදේශීය ශ්‍රව්‍ය දෘෂ්‍ය මාධ්‍ය ඇතුළු හොඳ පුස්තකාල එකතුවක් ගොඩනැංවීම

06. පර්යේෂකයන්ට, ප්‍රතිපත්ති සම්පාදකයන්ට, ප්‍රතිපත්ති සැළසුම්කරුවන්ට හා පරිපාලන නිලධාරීන්ට අදාළ තොරතුරු ලබාදීම

යම් කිසි පර්යේෂණ කාර්යයක නිරත වී ඇති පර්යේෂකයන්ට තම අරමුණු හා අභිමතාර්ථ ඉටු කර ගැනීම සඳහා අදාළ විෂයට සම්බන්ධ තොරතුරු එකතු කර ගැනීමට සිදු වේ. මෙම අවශ්‍යතා සම්පූර්ණ කිරීම විඥාපන ආයතන මගින් සිදු කළ යුතුය. විශේෂිත පුස්තකාල විවිධ වර්ග වලින් දැකිය හැකිය. රාජ්‍ය, පෞද්ගලික, යම්කිසි සමාජයකට හෝ ආයතනයකට සම්බන්ධ පුස්තකාල ඒ අතර වෙති. දෙස් විදෙස් පිහිටුවා ඇති විශේෂ පුස්තකාල ගණන අතිමහත්ය. මෙම පුස්තකාල කෘෂිකර්මාන්තය, ආර්ථිකය, කර්මාන්ත ආදී විවිධ විෂය ක්ෂේත්‍ර ඉලක්ක කරගෙන පිහිටුවා ඇති බව පෙනේ.

*උදාහරණ :-*

- රබර් පර්යේෂණායතන පුස්තකාලය
- මහබැංකු පුස්තකාලය
- ජාත්‍යන්තර ජල කළමනාකරණායතන පුස්තකාලය
- පුරාවිද්‍යා දෙපාර්තුමෙන්තුවේ පුස්තකාලය
- පේරාදෙණිය කෘෂිකර්ම දෙපාර්තුමෙන්තු පුස්තකාලය
- බ්‍රිතාන්‍ය ගෘහනිර්මාණ ශිල්පීන්ගේ සංගම් පුස්තකාලය
- එංගලන්තයේ පුස්තකාල සංගම් පුස්තකාලය සහ මධ්‍යම බැංකු පුස්තකාලය
- Association of Special Libraries and Information Bureau In Britain

මේ අනුව නොයෙක් විෂය අවශ්‍යතා වෙනුවෙන් පිහිටුවා ගත් මෙම පුස්තකාල මගින් පර්යේෂකයන්ගේ පර්යේෂණ අවශ්‍යතා සම්පූර්ණ කිරීම ප්‍රමුඛ වගකීම වේ. සාම්ප්‍රදායික පුස්තකාල සේවා වලින් බැහැරව විශේෂිත තොරතුරු සේවා ක්‍රියාත්මක වීම අත්‍යාවශ්‍යය.



## විශේෂ පුස්තකාලයක සේවා

විශේෂ පුස්තකාලක් මගින් සිදු කරනු ලබන සුවිශේෂි සේවාවන් පිළිබඳ හැඳින්වීම මෙම අධ්‍යයනයේ ප්‍රමුඛ අරමුණ වේ. විශේෂ විෂයකට සීමා වන බැවින් එම විෂයට අදාළව ප්‍රකාශයට පත් වී ඇති විමර්ශන ග්‍රන්ථ පුස්තකාලය සතු විය යුතු අතර උපයෝජකයන්ගේ තොරතුරු අවශ්‍යතා සඵල කිරීම, කාලය ආරක්ෂා කිරීම, අවශ්‍ය තොතුරු සඳහා සෘජු එළඹුම් ලබා දීම මෙම විශේෂිත සේවා මගින් අභිප්‍රේත වන අතර එකී සේවාවන් කොටස් දෙකක් යටතේ දැක්විය හැකිය.

| ප්‍රවර්තන සාවධාන සේවය<br>**Current Awareness Services (CAS)** | වරණීය විඥාපන සේවය<br>**Selective Dissemination Information (SDI)** |
|---|---|
| 01. ප්‍රවර්තන සාවධාන ලැයිස්තු | 01. සාරසංග්‍රහ සේවය |
| 02. පටුන පිටු සේවය | 02. අනුක්‍රමණිකාකරණය |
| 03. වාර සඟරා සංසරණ ක්‍රමය | 03. සාහිත්‍ය ගවේෂණය |
| 04. පුවත්පත් කැපුම් සේවය | 04. නිර්දේශිත සේවා |
| 05. පරිග්‍රහණ ලැයිස්තු සේවා | 05. පරිවර්තන සේවා |
| 06. සම්මන්ත්‍රණ හා පර්යේෂණ පිළිබඳ දැනුවත් කිරීම | 06. අන්තර් පුස්තකාල පිරුළු සේවය |

## 01. ප්‍රවර්තන සාවධාන සේවය (Current Awareness Services - CAS)

ප්‍රවර්තන සාවධාන සේවාවේ දී පුස්තකාලය මගින් ප්‍රතිග්‍රහණය කර ගන්නා ලද පුස්තකාල සම්පත් පිළිබඳ තොරතුරු ඉක්මනින් උපයෝජකයන්ට ලබා දීම සිදු කරනු ලබයි. වර්තමානය වන විට විවිධ පර්යේෂණ හා ගවේෂණ මගින්

තොරතුරු නිරන්තරයෙන් බිහි වන අතර ඒ පිළිබඳ උපයෝජකයන් වෙත එම මෙහොතේම දැනුවත් කිරීම මෙමගින් සිදු වේ. මේ සඳහා පරිගණක තාක්ෂණයේ දියුණුව ද හේතු වී ඇත. පුස්තකාල හා විඥාපන විද්‍යා විෂය පිළිබඳ ජාත්‍යන්තර විශ්වකෝෂයේ දී ප්‍රවර්තන සාවධාන සේවාව පිළිබඳ මෙසේ නිර්වචනය කර ඇත. " Notifying current document to users of libraries and information science" (The International Encyclopedia of Information and Library Science - Current awareness, 2003). මෙහි දැක්වෙන පරිදි පුස්තකාල හා තොරතුරු සේවා ආයතනයන්හි උපයෝජකයන්ට තම ආයතන මගින් ප්‍රතිග්‍රහණය කර ගත් නව දැනුම පිළිබඳ දැනුමත් කිරීම ප්‍රවර්තන සාවධාන සේවාවේ ස්වභාවය ලෙස පෙන්වා දී ඇත. තව ද Johnson නම් තැනැත්තා මෙම සේවාව පිළිබඳ මෙසේ අදහස් දක්වා ඇත. "Today CA Services alert scholars, researchers and health care practitioners to recent published literature in their field of specialization" (Johnson, 2009 : 52 p.). මෙම නිර්වචනයට අනුව විද්වතුන්, පර්යේෂකයන් හා සෞඛ්‍ය සේවා පුහුණුවන්නන්ට ඔවුන් නියෝජනය කරන විෂය ක්ෂේත්‍රයන්හි නව ප්‍රකාශන පිළිබඳ දැනුමත් කිරීම ප්‍රවර්තන සාවධාන සේවාව මගින් සිදු කරන බව පෙන්වා දී ඇත. මේ අනුව පර්යේෂකයන්ට හෝ ගවේෂකයන්ට විශේෂ තොරතුරු මධ්‍යස්ථාන මගින් නව ප්‍රකාශන හා සම්පත් පිළිබඳ කඩිනමින් දැනුමත් කිරීමේ සේවාව ප්‍රවර්තන සාවධාන සේවා ලෙස හැඳින්විය හැකිය.

### 1.1 ප්‍රවර්තන සාවධාන ලැයිස්තුः (CAS Lists)

ප්‍රවර්තන සාවධාන ලැයිස්තු මගින් සිදු කරනු ලබන්නේ යම් විෂය ක්ෂේත්‍රයක් සඳහා නාමාවලි සකස් කිරීමයි. උදාහරණ ලෙස American Chemistry Society මගින් රසායානික විද්‍යාව පිළිබඳ තොරතුරු නාමාවලියක් සකස් කර ඇත. මෙම නාමාවලිය Chemical name, Chemical formula සහ CAS number යටතේ පෙළ ගැස්වීමක් සිදු කොට ඇත. පර්යේෂකයන්ට මෙම ලැයිස්තු භාවිත කරමින් තොරතුරු සඳහා ප්‍රවේශ විය හැකිය.



### 1.2 පටුන පිටු සේවයः (Content pages service)

පටුන පිටුසේවාව මගින් සිදු කරනු ලබන්නේ විශේෂ පුස්තකාලයන්හි ඇති සඟරා, පොත් ආදී පුස්තකාල සම්පත්වල මුල් පිටු එකට එකතු කොට බැඳ තැබීමයි. මෙසේ පටුන පිටු සේවාව මගින් උපයෝජකයන්ට අවශ්‍ය මූලාශ්‍රය වෙත ප්‍රවේශ වීම සඳහා සඟරාවන්හි මුල් පිටු දක්වනු ලබයි. අද වන විට බොහෝ තොරතුරු මධ්‍යස්ථාන මගින් මුල් පිටු Scan කර පරිගණක හරහා මාර්ගගතව ලබා දෙනු ලබයි.

### 1.3 වාර සඟරා සංසරණ ක්‍රමයः (Periodical Circulation)

වාර සඟරා සංසරණ ක්‍රමය යනුවෙන් අදහස් කරනු ලබන්නේ විශේෂ පුස්තකාල මගින් තම පුස්තකාල සතු විෂයාත්මක වටිනාකමක් සහිත වාර සඟරා හුවමාරු කර ගෙන භාවිත කිරීමයි. මෙහි දී යම් පුස්තකාලයකට තම උපයෝජකයන් සඳහා අවශ්‍ය සඟරා තම පුස්තකාලයේ නොවූව ද වෙනත් පුස්තකාලයකින් දක්වා ඇති කොන්දේසිවලට යටත්ව ලබා ගත හැකිය.

### 1.4 පුවත්පත් කැපුම් සේවයः (Paper Cutting Service)

පුවත් පත් කැපුම් සේවාව තවත් එක් වැදගත් තොරතුරු සේවාවක් වේ. මෙහි දී පුවත්පත්හි ඡායා පිටපත් යොදා ගනු ලබයි. සංරක්ෂිත වු අම්ල බවින් උදාසීන කාඩ්බෝඩ් පෙට්ටි තුළ උක්ත පුවත්පත් ලිපිවල ඡායා පිටපත් කැපුම් ගබඩා කරනු ලබයි. විෂය අනුව වෙන් කර තැන්පත් කළ හැකිය.

*උදාහරණ* : රබර් පර්යේෂණායතන පුස්තකාලයට රබර් පිළිබඳ පුවත් පත් ලිපි කැපුම් එක් රැස් කර ගත හැකිය.

### 1.5 පරිග්‍රහණ ලැයිස්තු සේවාः (Accession List)

පුස්තකාලයක් විසින් තම පුස්තකාලයට සම්පත් අත්පත් කර ගැනීමේ දී පරිග්‍රහණ ලැයිස්තුවක් සකස් කරනු ලබයි. මෙය පරිග්‍රහණ ලේඛනය ලෙස ද හැඳින්වේ. මෙම ලැයිස්තු ප්‍රදර්ශනය

කිරීම, ඊ-මෙල් (e-mail) මගින් උපයෝජකයන් දැනුවත් කිරීම පරිග්‍රහණ ලැයිස්තු සේවාවේ දී සිදු කරනු ලබයි.

### 1.6 සම්මන්ත්‍රණ හා පර්යේෂණ පිළිබඳ දැනුවත් කිරීම

විශේෂ පුස්තකාලයක් විෂය විශේෂිතව සිදු කරනු ලබන පර්යේෂණ හා සම්මන්ත්‍රණ පිළිබඳ තම උපයෝජකයින් දැනුමත් කිරීම මේ සේවාව යටතේ සිදු කරනු ලබයි. සම්මන්ත්‍රණ හා පර්යේෂණ පිළිබඳ දැනුමත් කිරීම ක්‍රම 02 ක් යටතේ සිදු කෙරේ. (Menzel, 1964: 6 p.)

01. ඉදිරියේ දී පැවැත්වීමට අපේක්ෂිත සම්මන්ත්‍රණ පිළිබඳ දැනුම් දීම
    (Notification of Post Coming Conversation)
02. සිදු කෙරෙමින් පවතින පර්යේෂණ පිළිබඳ දැනුම් දීම
    (Research in Progress)

මෙම සේවාව මගින් අදාළ විෂය ක්ෂේත්‍රයානුබද්ධව සිදු කළ හා කෙරෙන පර්යේෂණ හා සම්මන්ත්‍රණ පිළිබඳ (දැන්වීම්, කෙටි පණිවිඩ හා ඊ - මෙල් ආදී මාර්ග භාවිත කරමින්) උපයෝජකයන් දැනුමත් කරනු ලබයි.

වර්තමානයේ දී විශේෂිත වූ තොරතුරු මධ්‍යස්ථාන තම සේවා පිළිබඳ උපයෝජකයන් දැනුමත් කිරීම සඳහා ප්‍රවර්තන සාවධාන සේවය (Current awareness services CAS) පරිගණකය හා බද්ධව නොයෙක් සේවාවන් සිදු කරනු ලබයි. ඒ අතර Journal alerting, BNA E-mail alerting, Current index to legal periodical, Law review title papers, Smart clips, Research now, Blogs, Wikis, Pod cast, Social media යන සේවා ප්‍රධානය. මේ අතුරින් සමාජ ජාල (Social media : Facebook, Twitter, Link in et..) සමාජය අතර බෙහෙවින් ජනප්‍රිය මාධ්‍යයකි. පර්යේෂණ කණ්ඩායම් අදාළ විෂය ක්ෂේත්‍ර සඳහා කණ්ඩායම් (group) නිර්මාණය කර තොරතුරු ඉදිරිපත් කිරීම, බෙදා හැරීම, තොරතුරු සඳහා ප්‍රවේශ වීම වැනි කාර්යයන් මගින් තම සාමාජිකයන් අතර තොරතුරු හුවමාරු කර ගත හැකිය.



### 02. වරණීය විඥාපන සේවයඃ (Selective Dissemination Information SDI)

වරණීය විඥාපන සේවය විශේෂ පුස්තකාල මගින් තම උපයෝජකයන්ට ලබාදෙන තවත් එක් සුවිශේෂී සේවාවක් වේ. මෙහි විශේෂත්වය වන්නේ තෝරාගත් පිරිසකට පමණක් ඔවුන්ගේ අවශ්‍යතාව අනුව තොරතුරු සැපයීමයි. H.P. Peter Lune මෙම සේවාව නිර්වචනය කරන්නේ මෙසේය. "විශේෂිත පුද්ගලයෙකුට තෝරාගත් තොරතුරක් ලබාදීම, එනම් පාඨකයාට අවශ්‍ය තොරතුරු පමණක් සැපයීම වරණීය විඥාපන සේවයයි" (Peter Lune, 1961)' තව ද "A refinement of the current awareness idea.. that is designed to save the individual scientist directly" (Strauss Shreve and Brown) යනුවෙන් Strauss Shreve and Brown යන දෙදෙන වරණීය විඥාපන සේවයේ දී ප්‍රවර්තන සාවධාන සේවාවේ අදහස් හා අභිප්‍රායයන් ශෝධනය කර ඒක පුද්ගල විද්‍යාත්මක නාමාවලියක් සැකසීම සිදු වන බව පෙන්වා දී ඇත. මේ අනුව වරණීය විඥාපන සේවාවේ දී පළමුව පුස්තකාලය සතු සම්පත් පිළිබඳ ප්‍රවේශ හා විඥාපන සකස් කර උපයෝජකයන්ගේ ඉල්ලීම පරිදි තොරතුරු ලබා දීම සිදු වේ. එසේම පාඨක රුචිකත්වය හා කැමැත්තට උචිත වන පරිදි මෙම සේවා ලබා ගත හැකි වේ. වරණීය විඥාපන සේවාව වර්තමානය වන විට අන්තර්ජාල භාවිතයෙන් ලබා ගත හැකිය. මෙම සේවාවේ මූලිකාංග පහතින් විස්තර කෙරේ.

### 2.1 සාරසංග්‍රහ සේවයඃ (Abstracting Service)

සාරසංග්‍රහ සේවය යනු පොතක්, පර්යේෂණ වාර්තාවක්, සඟරා ලිපියක් හෝ පත්‍රිකාදී කුමන හෝ ලේඛනයක අන්තර්ගත වන තොරතුරුවල, ඉදිරිපත් කර ඇති අනුක්‍රමය නො බිඳෙන සේ හැකිතාක් දුරට මුල් කතුවරයාගේ භාෂාව හෝ අර්ථය නොබිඳෙන ලෙස සංක්ෂිප්තව ඉදිරිපත් කිරීමයි. "A Systematic and thorough search of all types of published literature in order to identify as many item as possible that are relevant to a particular topic" (Gash, 2000:1 p.) වර්තමානය වන විට

නොයෙක් ආයතන හා සංවිධාන පර්යේෂණ වාර්තා, සමුළු පවත්වන අතර මාර්ගගතව හා මාර්ග අපගතව සාරසංක්ෂේප භාවිත කිරීමට හැකියාව ඇත. දනට Chemical Abstract, Social Science Abstract, LISA: Library & Information Science Abstract, Biography abstract, MEDLINE /PUBMED වැනි විෂයාත්මක සාරසංක්ෂේප සේවා ලොව පුරා පර්යේෂකයන්ගේ දැනුම් වර්ධනය සඳහා භාවිත කරනු ලබයි.

## 2.2 අනුක්‍රමණිකා සේවා: (Indexing Service)

කෘතියක අන්තර්ගත ප්‍රධාන නම්/ මාතෘකා, රීති, ග්‍රන්ථ නාම හෝ වෙනත් එබඳු වැදගත් ඕනෑම දෙයකට සකස් කළ අකාරාදී ලැයිස්තුව අනුක්‍රමණිකාවක් ලෙස හැඳින්විය හැකිය. මෙය කාලක්‍රමානුගතව හෝ භූගෝල විද්‍යාත්මකව හෝ වෙනත් ආකාරයකට වින්‍යාස ගත කෙරේ. අනුක්‍රමණිකාවක් යනු යම්කිසි තොරතුරක් සොයා ගැනීමට පදනම් කරගනු ලබන අකාරාදී පද එකතුවකි. මෙම පදයෙහි පෙන්නුම් කිරීම යන අර්ථය ඇති අතර එයින් අර්ථවත් වන්නේ කිසියම් මූලාශ්‍රයක් වෙත එළඹුම ලබා දීම මෙමගින් සිදු වන බවයි. Indexing යන වචනය "Indicate" යන්නෙන් බිඳී ආවකි. අනුක්‍රමණිකාකරණය තොරතුරු සමුද්ධරණය සඳහා ඇති තරගත්නා ලද විධිමත් පාලන ක්‍රමයකි. තොරතුරු සමුද්ධරණයේ දී පහසුවෙන් සහ ක්ෂණිකව තොරතුරු සොයා ගැනීමේ මෙවලමක් ලෙස අනුක්‍රමණිකාකරණය වැදගත් වේ. තවත් විධියකින් දක්වන්නේ නම් අනුක්‍රමණිකාවක් කිසියම් ප්‍රලේඛන එකතුවකින් යම් කිසි ප්‍රලේඛනයක් සොයා ගැනීම සඳහා අවශ්‍ය ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු ඇතුළත් කරන ලේඛනයක් ලෙස සඳහන් කළ හැකිය.

මේ අනුව කිසියම් ලේඛනයක අන්තර්ගත කරුණු මෙහි දී ඇතුළත් කරනු ලබයි. එනම් ග්‍රන්ථ නාමය, ලිපි ශීර්ෂ, කර්තෘ, සඟරා නාමය, කලාපය, බාණ්ඩය, අංක, ලිපි අන්තර්ගත වන පිටු අංක ආදීය පිළිබඳ සෑම කරුණක් පිළිබඳව ම ප්‍රමාණවත් ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු සපයන හෝ පෙන්නුම් කරන ක්‍රමානුකූලව පිළියෙල කරන ලද අකාරාදී ලැයිස්තුවකි.



අනුක්‍රමණිකාවකින් කරනු ලබන්නේ ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු දැක්වීමක් පමණි. අනුක්‍රමණිකාවක් මගින් එක් එක් සංලේඛය යටතේ එකී සංලේඛයේ මගින් ප්‍රකාශන හඳුනා ගැනීමට අවශ්‍ය සියලුම ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු ඇතුළත් කෙරේ. අනුක්‍රමණිකාවක් කිසියම් විෂයක් අනුව හෝ එසේ නැතිනම් කර්තෘ ග්‍රන්ථ නාම අකාරාදී පිළිවෙළකට සකස් කර ගත හැකිය. "සංවිධානය කරන ලද යම් කිසි කරුණකට හෝ කරුණු කිහිපයකට (ප්‍රවේශ ගත වීමට අවශ්‍ය) සකස් කරනු ලැබූ මෙවලමකි" (Rowely, 1988) යනුවෙන් අනුක්‍රමණිකාකරණයේ මූලික ලක්ෂණය Rowely විසින් නිර්වචනය කර ඇත. තව ද catz විසින් විමර්ශන මූලාශ්‍ර හා සේවා සඳහා සිදු කරන හඳුන්වා දීම අනුක්‍රමණිකාකරණය ලෙස විස්තර කර ඇත. "Introduction to reference sources of services" (Katz, 1992) පහතින් විෂය අවශ්‍යතා සඳහා විශේෂිත තොරතුරු මධ්‍යස්ථාන හා ආයතන සම්පාදනය කරනු ලබන අනුක්‍රමණිකා පහතින් දක්වා ඇත.

*උදාහරණ :*

(Science Index, Agrindex, Index Medicos Biological Science Index, Education Index, Social science Index, British Humanities Index)

## 2.3 සාහිත්‍ය ගවේෂණය: (Literary Survey)

පර්යේෂණවල නියැලෙන්නන්ට අවශ්‍ය සියලු තොරතුරු එකම තැනකින් ගත හැකි වන පරිදි පහසුකම් සැපයීම සාහිත්‍ය ගවේෂණය මගින් සිදු කෙරේ. සමපේක්ෂණය මත විෂයානු බද්ධ සියලු සාහිත්‍ය උපයෝජකයින් වෙනුවෙන් සකසා තැබීම පුස්තකාල හා තොරතුරු මධ්‍යස්ථානවල වගකීම වේ. සමපේක්ෂණය යනු අනාගතයේ දී පාඨකයා පැමිණේවියැයි උපකල්පනය කිරීම වන අතර ඒ සඳහා කටයුතු යෙදීම මෙමගින් සිදු වේ. මෙම සේවා නිසා පර්යේෂකයාගේ කාලය ආරක්ෂා වන අතර පාඨකයාට අවශ්‍ය වෙලාවේ දී අවශ්‍ය ආකාරයට තොරතුරු ලබා දීම පර්යේෂණයේ සාර්ථකත්වයට ද හේතු වේ.

### 2.4 නිර්දේශිත සේවා: (Referral service)

යොමුගත සේවාව යන නමින් ද හඳුන්වන ලබන නිර්දේශිත සේවාව තවත් එක් වරණීය විඥාපන සේවාවක් වේ. යොමුගත සේවා ක්‍රියාත්මක මධ්‍යස්ථාන ලොව පුරා පිහිටා ඇති අතර ඒවා යොමුගත සේවා මධ්‍යස්ථාන ලෙස හඳුන්වනු ලබයි. යොමුගත සේවාවේ දී උපයෝජකයන්ට අවශ්‍ය විඥාපන සඳහා මග පෙන්වීම සිදු කෙරේ. ක්‍රිෂන් කුමාර් විසින් මෙම සේවාව නිර්වචනය කර ඇත්තේ මෙසේය.

> "The process of linking a person with need/ problem with a service which will meet the need or solve the problem"
>
> *(Krishan Kumar)*

මෙහි දී "අවශ්‍ය ප්‍රශ්නය හා ඊට අවශ්‍ය විසඳුම සම්බන්ධ කරන සේවාව යොමුගත සේවයයි " යනුවෙන් දක්වා ඇති අතර උපයෝජකයන්ගේ අවශ්‍යතා හඳුනා ගනිමින් ඒ සඳහා තොරතුරු හා මූලාශ්‍ර සැපයීම මෙයින් අර්ථවත් වේ. එනම් උපයෝජක අවශ්‍යතාව ජීවන චරිතයක් පිළිබඳ දැන ගැනීමට නම් ඒ සඳහා අවශ්‍ය චරිතාප්‍රදාන ලබා දීමත්, වචනාර්ථ සඳහා සුදුසු ශබ්දකෝෂ සැපයීමත් මෙම සේවාව යටතේ සිදු කළ හැකිය.

### 2.5 පරිවර්තන සේවා: (Translation Service)

පර්යේෂණ, ගවේෂණ හා නොයෙක් සිදුවීම් මත ප්‍රාථමික, ද්විතීක හා තෘතික වශයෙන් තොරතුරු නිරන්තරයෙන් බිහි වේ. එසේ බිහිවන තොරතුරු එක් භාෂාවකින් පමණක් සීමා නොවේ. "වර්තමානය වන විට බිහිවෙන තොරතුරු වලින් 50% ක් ඉංග්‍රීසි භාෂාවෙන් ද, 20% ක් රුසියන් භාෂාවෙන් ද, 8% ක් ජර්මන් භාෂාවෙන් ද, 5% ක් ප්‍රංශ භාෂාවෙන් ද, 5% ජපන් භාෂාවෙන් ද, බිහිවේ." (International translation services web page, 2012) මේ නිසා විශේෂ පුස්තකාල හා තොරතුරු මධ්‍යස්ථාන මගින් පරිවර්තන සේවා ක්‍රියාත්මක කිරීම අත්‍යාවශ්‍ය වේ. ඒ සඳහා පහත ක්‍රියාමාර්ග අනුගමනය කළ හැකිය.



01. විදේශ භාෂා පිළිබඳ පුහුණුවක් ලබා දීම
    (Imparting of foreing language training to Scientist)
02. වාග් විද්‍යාත්මක මූලාශ්‍ර වර්ධනය කිරීම
    (Development of special linguistic tool)
03. පරිගණක පරිවර්තන සේවා ක්‍රියාත්මක කිරීම
    (Computer guided translation)
04. පිටුවෙන් පිටුව පරිවර්තනය
    (Cover to cover translation)
05. පාඨකයගේ ඉල්ලීම පරිදි ලබා දෙන පරිවර්තන සේවාව
    (Translation on customer demand)
06. පරිවර්තන කණ්ඩායම් මගින් ලබා දෙන පරිවර්තන සේවා (Formation of translation pool)

ඉහත ක්‍රමවේද භාවිත කරමින් පරිවර්තන සේවා ක්‍රියාත්මක කිරීම සිදු වන අතර ඒ සඳහා පහත ආයතන නිදසුන් ලෙස දැක්විය හැකිය.

- National Translation Centre, Jhon Crerar Library, Chicago
- International Translation Center

### 2.6 අන්තර් පුස්තකාල පිරුළු සේවය: Inter Library Loan Service)

පුස්තකාල සහයෝගීතා ක්‍රම අතර අන්තර් පුස්තකාල පිරුළු සේවයට ප්‍රමුඛතාවයක් හිමි වේ. පුස්තකාලකට හෝ තොරතුරු මධ්‍යස්ථානයකට තම උපයෝජකයන්ගේ හා පර්යේෂකයන්ගේ අසීමිත තොරතුරු අවශ්‍යතාවයන් තනිව සම්පූර්ණ කිරීමට හැකියාවක් නොමැත. මේ සඳහා තොරතුරු විශාල ලෙස බිහිවීමත්, තොරතුරු බිහිවන මාධ්‍යයන්හි මිළ අධික වීමත් වැනි කරුණු හේතු වී ඇත. එම නිසා විෂයාත්මක වශයෙන් එක්ව පොදුවේ තම සම්පත් හුවමාරු කර ගැනීම අන්තර් පුස්තකාල පිරුළු සේවය යනුවෙන් හඳුන්වනු ලබයි. මෙහි පිරුළු යන

පදයෙහි ණයට ගැනීම හෝ දීම යන අරුත් ගැබ්ව ඇත. එනම් පුස්තකාල සමූහයක් අතර වාචික හෝ ලිඛිත එකඟතාවක් මත පුස්තකාල සම්පත් හුවමාරු කර ගැනීම, යම් කාලසීමාවකට ලබාදීම මෙමගින් සිදු වන අතර මෙම සේවාව යටතේ උපයෝජකයන්ගේ තොරතුරු අවශ්‍යතාවන් සම්පූර්ණ කිරීමට පුස්තකාලවලට හැකියාව ලැබී ඇත.

මේ අනුව වරණීය විඥාපන සේවය ඉහත ක්‍රියාකාරකම් මගින් සිදු කළ හැකි අතර මෙම සේවාවන්වලට අමතරව Reprographic service, Document delivery service (Indian National Scientific Documentation Centre), Bio mail, Pub Crawler, JADE, Science direct, OVID MEDLINE, My NCBI වැනි සේවාවන් මාර්ගගතව හා මාර්ග අපගතව තොරතුරු ලබා දීම සිදු කරනු ලබයි.

## නිගමනය

විශේෂ පුස්තකාල මගින් තම උපයෝජකයන්ගේ තොරතුරු අවශ්‍යතාව සම්පූර්ණ කිරීම සඳහා ලබා දෙන සේවාවන් ලෙස ප්‍රවර්තන සාවධාන සේවාව හා වරණීය විඥාපන සේවාව හැඳින්විය හැකිය. මෙහි දී ප්‍රවර්තන සාවධාන සේවාව මගින් නව තොරතුරු පිළිබඳ උපයෝජකයින් එසැණින් දැනුමත් කරනු ලබන අතර වරණීය විඥාපන සේවාවේ දී තම පුස්තකාලයේ හෝ තොරතුරු මධ්‍යස්ථානයේ ප්‍රතිග්‍රාහිත තොරතුරු සංවිධානය කර උපයෝජක ඉල්ලීම් පරිදි තොරතුරු ලබා දෙන සුවිශේෂී සේවාවක් ලෙස හැඳින්විය හැකිය.

## ආශ්‍රිත ග්‍රන්ථ

ගුණරත්න, ඊ. කේ (2005), 'විමර්ශන සේවාව හා මූලික විමර්ශන ග්‍රන්ථ' පුස්තකාල හා විඥාපන විද්‍යා ලේඛන සමුච්චය, පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය.

ගුණසේකර, ධනපාල (1998), පුස්තකාල සේවාවේ මූලිකාංග, ගොඩගේ, කොළඹ.



ජයතිස්ස, එල්. ඒ (1999), පුස්තකාල කළමනාකරණය, කතෘ ප්‍රකාශන, කැලණිය.

ප්‍රේමදර්ශන, විජය 2007, විමර්ශන පුස්තකාල, විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය, කොළඹ.

Cohen, Steven M. (2004). Eight steps for keeping current. Knowledge Quest, 33(1), 40-41.

Connor, J. H. (1967). Selective Dissemination of Information: A review of the literature and the issues. The Library Quarterly, 37(4), 373-391.

Gash, S. (2000) Effective Literature Searching for Research 2nd Ed., Aldershot: Gower Publishing Ltd.

Hensley, C. B. (1963). Selective dissemination of information (SDI): State of the art in May,1963. New York: Association of Computing Machinery (ACM).

Johnson, Stephen M.; Osmond, Andrew; & Holz, Rebecca J. (2009). Developing a current awareness service using really simple syndication (RSS). Journal of Medical LibraryAssociation, 97(1), 52-54.

Katz, W. A. (1992). Introduction to reference work, vol. 2, Reference services and reference processes, 6th ed. New York: McGraw-Hill, Inc.

Kolder, H.; & Simpkins, I. F. (1967). Selective dissemination of information and theacademicscience library. College & Research Libraries, 28(1), 53-57.

Menzel, H. (1964). The information needs of current scientific research, The Library Quarterly, 34, 4-19.

Shafique, Farzana. (2009). Marketing research as a tool for finding library users' needs and demands: Application of three party theory. Library Philosophy and Practice. Retrieved 21 December 2012 from: http://unllib.unl.edu/LPP/shafique.htm

Siriwardena, P. L. (2005). Current awareness services in special libraries and university Libraries. University of Colombo, Sri Lanka.

Rowley, J (1988). Abstracting and Indexing. 2nd ed. London: Clive Bingley. p 15.